## දේශීය වාද්‍ය භාණ්ඩ

### 01. තම්මැට්ටම

තම්මැට්ටම යනු දේශීය වාද්‍ය භාණ්ඩ අතර සුවිශේෂී වූ වාද්‍ය භාණ්ඩයකි. හැඩය හා වාදනය කරන අකාරය අනෙකුත් වාද්‍ය භාණ්ඩ වලට වඩා වෙනස් ආකාරයක් ගනී. එම වාද්‍ය භාණ්ඩය මුහුණත් දෙකකින් යුක්තය. මෙය පොකුරු බෙරය යන නමින්ද හැඳින්වේ.

හඬ තීව්‍ර වූ කොටස හඬ බැය යන නමින්ද, හඬ බැයට වඩා මදක් විශාල වූ හඬ ගැඹුරින් ද යුක්ත වූ කොටස මණ්ඩම යන නමින්ද හඳුන්වනු ලබයි. මෙය විතත වාද්‍ය භාණ්ඩ ගණයට භාණ්ඩ වර්ගීකරණයේදී හඳුන්වයි.

තම්මැට්ටමේ කඳ සකස් කර ගැනීමට, කොහොඹ, කොස්, ගංසූරිය වැනි දැව වර්ග යොදා ගනියි. එක පැත්තකින් හාරන ලද තම්මැට්ටම් කඳ සඳහා හරක් හම් යොදා බැඳ ගනියි. මණ්ඩම කොටසට හරක් හමද හඬ බැය සඳහා මුව හම හෝ එළු හමද යොදා ගනියි.මේ සඳහා යොදා ගන්නා වරපට තරමක් පළලින් යුක්තය. හඬ බැය සඳහා තට්ටුවෙහි ආරක්ෂාවට සුරත්තට්ටුව නම් කොටසක් යොදා ගනියි.මෙම තම්මැට්ටම වාදනය කිරීම සඳහා කඩිප්පු දෙකක් යොදා ගනියි.






අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.

## 02. උඩැක්කිය

දේශීය අවනද්ධ භාණ්ඩ අතර කුඩාම වාද්‍ය භාණ්ඩය වන්නේ උඩැක්කිය යි. අනෙකුත් භාණ්ඩ අතර මෙය වෙනස්ය. හින්දු ආගමික මත අනුව ශිව දෙවියන්ගේ හස්තයක බමරු හෙවත් උඩැක්කිය ඇති බව සඳහන් වේ. ග්‍රහපන්ති කවිවල හිරු දෙවියන්ගේ එක් අතක උඩැක්කිය ඇති බව සඳහන් වන බැවින් එය සිරිවස යන නමින්ද හඳුන්වන බව කියයි. උඩැක්කිය සඳහා යොදා ගන්නේ ගංසූරිය නම් දැව වර්ගයයි. ඊට අමතරව ඇහැළ, කොහොඹ, වරකා, වැනි දැව වර්ගද යොදා ගනියි. ලීයෙහි කඳ මැද සිහින්ව ආකාරයට සකස් කොට ඇත. දෙපසින් මහත්ව සිටින ආකාරයට සකස් කර ඇත.

උඩැක්කියේ දකුණු ඇසට තලගොයි හම් හෝ වඳුරු හම් හෝ යොදා ගනියි. වම් පස ඉතා තුනී වූ එළු හම් යොදා ගනියි. ලියවා ලාක්ෂා කර ගැනීමෙන් උඩැක්කි කඳ සකස් කර ගනියි. මෙම කඳ වර්ග කීපයකින් අලංකාර කර ගනියි.

හඬ සකස් කර ගැනීම සඳහා වම් පස මුහුණට කිතුල් තතක් බඳිනු ලබයි. උඩැක්කියේ දිග එක් වියත් තුනඟුලකි. අවශ්‍ය පරිදි හඬ නිපදවා ගැනීමට මැදින් තද කිරීමෙන් හා ලිහිල් කිරීමෙන් අවශ්‍ය පරිදි යොදා ගනියි. එසේ කරන අතර සම මතුපිට අත්ලෙන් හඬ උපදවා ගනියි.






අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.

## 03.රබාන

විවිධ රබන් වර්ග දක්නට ලැබේ.ඒවා නම් බංකු රබන්, විරිඳු රබන්, අත් රබන් හා කරකවන රබන් ය. රබානේ කඳ සඳහා බොහෝ විට යොදා ගන්නේ කොස් ලීයයි. මිල්ල ලී වර්ගයද යොදා ගනියි. මුහුණත සඳහා යොදා ගන්නේ එළු හම් හෝ හරක් හම් ය. රබන් වළල්ල වටේ මෘදු කරගත් හම් වර්ග අතුරන ලද අතර සම ඇදී යාම වැළැක්වීම සඳහා හරක් හම් පටියක් වටේ යවා ඒ මත ඇණ ගසනු ලබයි.



අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.